# 2024 නොවැම්බර් 21 බ්‍රහස්පතින්දා
# දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරය උත්සවාකාරයෙන් විවෘත කිරීම සහ උත්සවය පිළිබඳ විස්තර සටහන

දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි රැස්වීම 2024 නොවැම්බර් 21 බ්‍රහස්පතින්දා පූ.භා. 10.00ට ආරම්භ කරනු ලැබේ.

**පාර්ලිමේන්තුවට පැමිණීම:** පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් යටත් පිරිසෙයින් පූ.භා 9.30 වනවිට පාර්ලිමේන්තුවට පැමිණීම අවශ්‍ය ය. ඔවුහු තම කලත්‍රයා සමඟ පැමිණෙන්නේ නම් කාර්ය මණ්ඩල ප්‍රවේශද්වාරය අභියසදී තම රථවලින් බැසිය යුතු අතර සෙසු සියලුම මන්ත්‍රීවරයන්, මන්ත්‍රී ප්‍රවේශද්වාරය අභියසදී තම රථවලින් බැසිය යුතු ය.

පාර්ලිමේන්තුව කරා පැමිණීමෙන් පසු මන්ත්‍රීවරයන්ගේ රථ පොලිස් නිලධාරින් විසින් නියමිත රථ ගාල වෙත යවනු ලැබේ.

**වැඩ පිළිවෙළ:** පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් පාර්ලිමේන්තුවේ ප්‍රවේශ ශාලාවට පිවිස ගණපූරණ සීනු නාද කරනු ලබන තෙක් එහි රැඳී සිටිය යුතු ය.

පූ. භා. 9.55 සිට විනාඩි පහක් ගණපූරණ සීනු නාද වන අතර මන්ත්‍රීවරයන් සභා ගර්භයෙහි රැස්වීමෙන් පාර්ලිමේන්තුවේ වැඩ කටයුතු ආරම්භ වනු ඇත. පූ. භා. 10.00ට සීනු නාද වීම නතරවන අතර, වේත්‍රය රැගත් වේත්‍රධාරීවරයා සභා ගර්භයට පිවිසෙනු ඇත. වේත්‍රධාරීවරයා සභා මේසය වෙත ගොස් වේත්‍රය එහි පහළ රැඳවුමෙහි තබන තෙක් මන්ත්‍රීවරයන් ස්වකීය අසුන්වලින් නැගී සිටිය යුතු ය. වේත්‍රධාරීවරයා අසුන් ගැනීමෙන් පසු, පාර්ලිමේන්තුව කැඳවීමේ ගරු ජනාධිපතිවරයාගේ ප්‍රකාශන පාර්ලිමේන්තුවේ මහ ලේකම් විසින් කියවනු ඇත. ඉනික්බිතිව පාර්ලිමේන්තුවේ මහ ලේකම්, කථානායකවරයෙකු ඡන්දයෙන් තෝරා පත් කිරීමෙහි වහාම නිරත වනු ඇත.

කථානායකවරයෙකු ඡන්දයෙන් තෝරා පත් කිරීමේ පිළිවෙළ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 4හි දැක්වේ. කථානායක ධුරයට මන්ත්‍රීවරයෙකුගේ නමක් යෝජනා කරනු රිසි යම් මන්ත්‍රීවරයෙක් ස්වකීය ආසනයෙන් නැගී සිටි විට ඔහු වෙත පාර්ලිමේන්තු මහ ලේකම් අත දිගු කළ කල්හි, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 4(ආ) හි විස්තර කර ඇති ප්‍රකාර ඔහුගේ යෝජනාව ඉදිරිපත් කළ යුතු ය. නමක් යෝජනා කිරීමට එක් මන්ත්‍රීවරයෙකුට වැඩි දෙනෙක් තම අසුන්වලින් නැගී සිටියහොත්, පළමුවෙන් යෝජනාව ඉදිරිපත් කළ යුතු මන්ත්‍රීවරයා කවරෙකුදැයි පාර්ලිමේන්තුවේ මහ ලේකම් විසින් තීරණය කර එම මන්ත්‍රීවරයා වෙත අත දිගු කළ විට ඔහුගේ යෝජනාව ඉදිරිපත් කළ යුතු අතර එම යෝජනාව ඉදිරිපත් කිරීම හා ස්ථිර කිරීම අවසන් වන තෙක්, නැගිට සිටි අනෙක් මන්ත්‍රීවරයන් අසුන් ගත යුතු ය. කථානායක ධුරයට නම් යෝජනා කිරීමට අදහස් කරන මන්ත්‍රීවරයන් විසින් රැස්වීම ආරම්භ වීමට පෙර තම අදහස් පාර්ලිමේන්තුවේ මහ ලේකම්ට දැනුම් දීම සාමාන්‍ය සිරිතක් පමණක් නොව, වැඩ කටයුතුවල පහසුවට බොහෝ සේ ආධාර වන කරුණක් ද වේ.

ඡන්දයෙන් තේරී පත්වීමෙන් අනතුරුව, කථානායකවරයා පාර්ලිමේන්තුවේ මතයට අවනත වන බව දක්වන අතර යෝජක සහ ස්ථිරකරු විසින් එතුමා මූලාසනය වෙත කැඳවාගෙන යනු ඇත. කථානායකවරයා මූලාසනය වෙත පැමිණ අසුන් ගැනීමට පෙර, තමා තෝරා පත් කර ගැනීම ගැන ස්වකීය ස්තූතිය ඉතා ලුහුඬින් පාර්ලිමේන්තුවට ප්‍රකාශ කරනු ඇත. කථානායකවරයා මූලාසනාරූඪ වෙත්ම වේත්‍රධාරීවරයා විසින් සභා මේසයේ පහළ රැඳවුමෙහි ඇති වේත්‍රය ගෙන සභා මේසයේ ඉහළ රැඳවුමෙහි තබනු ඇත. ඉන් පසු කථානායකවරයා පාර්ලිමේන්තුවේ මහ ලේකම් ලවා තමාගේ ප්‍රතිඥා දීම හෝ දිවුරුම් දීම කරවා ගෙන මන්ත්‍රී නාම ලේඛනයෙහි අත්සන් තබනු ලැබේ. මෙම අවස්ථාවේදී කථානායකවරයා වශයෙන් එතුමා තෝරා පත්කර ගැනීම ගැන පක්ෂ නායකත්වයන් විසින් සතුට පළ කෙරෙන කථා පවත්වන අතර, කථානායකවරයා නැවත වරක් පාර්ලිමේන්තුවට ස්වකීය ස්තූතිය ප්‍රකාශ කරනු ඇත.

මන්ත්‍රීවරයන්ගේ ප්‍රථම රාජකාරිය වනුයේ නීති ප්‍රකාර ප්‍රතිඥා දීම හෝ දිවුරුම් දීම බව කථානායකවරයා දැන් මන්ත්‍රීවරයන්ට සිහිපත් කර දෙනු ඇත. එතුමා විසින් ප්‍රතිඥා දීම හෝ දිවුරුම් දීම කරවීමෙහි නිරත වනු ඇත. මේ අවස්ථාවේදී දිවුරුම් පත්‍ර මන්ත්‍රීවරයන් වෙත බෙදා දෙනු ලබන අතර ඔවුන් තම ප්‍රතිඥා දීම හෝ දිවුරුම් දීම හෝ සිදුකර අත්සන් තැබීමට නියමිත මන්ත්‍රී නාම ලේඛනයෙහි අත්සන් තබා, පුරවා අත්සන් කරන ලද දිවුරුම් පත්‍ර පාර්ලිමේන්තුවේ මහ ලේකම්ට භාර දෙනු ඇත.

පැමිණ සිටින සියලු මන්ත්‍රීවරයන්ගේ නිල ප්‍රතිඥා දීම හෝ දිවුරුම් දීම අවසානයේදී පාර්ලිමේන්තුව නියෝජ්‍ය කථානායකවරයෙකු හා නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයෙකු තේරීමේ කාර්යයේ යෙදෙනු ඇත. මෙම කාර්යය, කථානායකවරයෙකු ඡන්දයෙන් තෝරාපත් කර ගැනීමේ දී අනුගමනය කරන පිළිවෙලට හැකි තරම් සමාන වන නමුත් ඡන්ද විමසීම කථානායකවරයා විසින් ම සිදු කරනු ලැබේ. (පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 6 බලන්න.)

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 32(4) සහ 33 ව්‍යවස්ථා ප්‍රකාරව ගරු ජනාධිපතිතුමා පාර්ලිමේන්තුව අමතනු ඇත.

ඉන්පසු පාර්ලිමේන්තුව කල් තැබීම සිදු කරනු ලැබේ.

**කුෂානි රෝහණදීර**
**පාර්ලිමේන්තුවේ මහ ලේකම්**